වත්තල -මාබෝල නගර සභාව
ගම්පහ දිස්ත්‍රික්කය

.1 මූල්‍ය ප්‍රකාශන
මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

1.1 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 27 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වත්තල නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------
පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.5,960,000 ක් වටිනා ගලි බවුසරය ගිණුම් ගතකොට නොතිබුණි.

(ආ) ආදායම් වෙනුවෙන් ලද රු.177,055 ක චෙක්පත් 05 ක් අගරු වීම හේතුවෙන් එම වටිනාකම තැන්පත් ගිණුමට හර කර, ණයගැති ගිණුම බැර කර තිබීම හේතුවෙන් ණයගැති හා තැන්පත් ගිණුම්වල ශේෂ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කසළ ආදායම්වලට අදාල අතිරේක බැර හා ශේෂ නිවැරදි කිරීම්, වෙන් වෙන්ව හඳුනා ගැනීම සිදු නොකොට ජර්නල් සටහන් 23 මඟින් සමුච්චිත අරමුදලට හර කර තිබූ වටිනාකම රු.112,600 ක් විය.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-------------------------
(අ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල ගිණුම හා උපලේඛන අතර විෂයයන් 05 ක වෙනස්කම්වල එකතුව රු.50,475,610 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් මුදල් ලැබීම පරිගණක දත්ත වාර්තා අනුව රු.52,179,954 ක් හා ලෙජරය අනුව රු.52,639,857 ක් වූයෙන් රු.459,903 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------
(අ) ලැබිය යුතු ගිණුම්
---------------------
2017 දෙසැම්බර් 31 දිනට රු. 9,340,982 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුළ 2012 දෙසැම්බර් 01 දින සිට පැවත එන රු.95,074 ක ශේෂයක් හා 2013 නොවැම්බර් 25 දින ගෙවන ලද රු.3,400,018 ක් හා 2013 දෙසැම්බර් 05 දින ගෙවන ලද රු.499,918 ක් ඇතුලත්ව තිබූ අතර ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

විවිධ තැන්පත් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව ශේෂය රු.56,764,433 ක් වූ අතර මෙයින් තැන්පත් වර්ග 26 ක රු.36,909,983 ක් වූ ශේෂ වසර ගණනාවක සිට නොවෙනස්ව පවතින නමුත් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

2017 දෙසැම්බර් 31 දිනට රු.28,634,895 ක් වූ හිඟ හිටි වෙනත් ආදායම් ශේෂයෙන් රු.17,716,942 ක් සඳහා උපලේඛන ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 189 | 394,951 | 2017 දෙසැම්බර් 31 දිනට වූ අගරු චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2016 අප්‍රේල් 28 දිනැති අංක LGD/2/2016 දරන චක්‍රලේඛය | 500,000 | 2017 ජූනි 09 දිනට කල්පිරි තිබූ ස්ථාවර තැන්පතුවක් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව ජංගම ගිණුමට බැර කර තිබුණි. |
| (ඇ) | බස්නාහිර පළාතේ 2008 අංක 1 දරන නාගරික සන අපද්‍රව්‍ය කළමනාකරණ රීති | | |
| | (i) 18(i) | - | අපද්‍රව්‍යවල ස්වභාවය හෝ ව්‍යාපාරයේ වර්ග අඩි ප්‍රමාණය අනුව ගාස්තු අයකළ යුතු වුවත් ආදායම් පරීක්ෂකවරයාගේ අභිමතය පරිදි කසළ අපහරණ ගාස්තුව තීරණය කර තිබුණි. |
| | (ii) 21(1) | - | දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් “ස්ථාන දඩ” අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,176,255 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.32,115.477 ක් විය.

2.2 මූල්‍ය පාලනය
--------------

වත්තල මහජන බැංකුවේ අංක 222-1-001-7-0976275 දරන ගිණුම වර්ෂ ගණනාවක සිට අක්‍රියව පවතින අතර 2017 දෙසැම්බර් 31 දිනට එහි රු.301,672 ක ශේෂයක් විය.

2.3 ආදායම් පරිපාලනය
----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` |
| (i) | වරිපනම් හා බදු | 55,801 | 55,968 | 53,598 | 55,875 | 57,150 | 58,634 | 66,538 | 60,882 |
| (ii) | කුලී | 14,022 | 15,607 | 15,111 | 18,788 | 13,751 | 12,486 | 12,842 | 23,317 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 450 | 1,431 | 1,396 | 1,174 | 1,400 | 1,814 | 2,005 | 1,140 |
| (iv) | වෙනත් ආදායම් | 79,091 | 36,752 | 35,070 | 28,635 | 79,698 | 58,895 | 52,450 | 26,105 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් සඳහා ඇස්තමේන්තුකර තිබූ මුදල රු.79,091,000 ක් වූ අතර එම ආදායමින් අයකර තිබූ ප්‍රතිශතය 44.34 ක් වූයෙන් අයකිරීම්වල ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණි.

(ආ) බලපත්‍ර ගාස්තු ආදායම් ප්‍රභවයට ව්‍යාපාර බදු ඇස්තමේන්තු කර නොතිබියදී රැස් කිරීම එයට ඇතුලත් කර තිබුණි.

2.3.2 වරිපනම් හා බදු

-----------------

(අ) වත්තල නගර මධ්‍යයේ පිහිටි නේවාසික පහසුකම්, විශේෂඥ සේවා පහසුකම් හා නවීන තාක්ෂණයෙන් සමන්විත වෛද්‍ය උපකරණ රැසකින් යුත් පෞද්ගලික රෝහලක් සඳහා 2012 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.20,181,818 ක් වූ අතර නව වැඩි දියුණු කිරීම් හඳුනාගෙන මුල් තක්සේරු වටිනාකම සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017 පෙබරවාරි 14 දිනැති කළමනාකරණ කමිටුව මගින් අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකම රු.50,000 ට වැඩි, දේපල තහනම් කර ඒවා අයකර ගැනීමට තීරණය කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.8,825,221 ක් වූ එවැනි හිඟ දේපල 53 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 ජනවාරි 01 දිනට අයකර ගතයුතු වරිපනම් හිඟය රු.51,932,028 ක් වූ අතර එයින් වර්ෂය තුළ අය කිරීම් කර තිබුණේ රු.19,805,812 ක් පමණි. ඒ අනුව හිඟ වටිනාකමින් සියයට 38 ක් පමණක් අයකර තිබූ බැවින් හිඟ වරිපනම් අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

2.3.3 කුලී

------

(අ) නගර සභාව සතු මස්කඩ හා මාළු කඩ 16 කට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.4,765,004 ක හිඟය අය කර නොතිබුණි.

(ආ) ඉතා ජනාකීර්ණ හා නගරාශ්‍රිතව පිහිටි නගර සභාව සතු කඩකාමර සඳහා 2008 වර්ෂයේදී නිශ්චය කර තිබූ මාසික කුලී වටිනාකම් කිසිදු සංශෝධනයකින් තොරව එලෙසින්ම සමාලෝචිත වර්ෂයේද අයකරමින් පැවතුණි.

(ඇ) හැඳළ වෙළඳ සංකීර්ණයට අයත් කඩකාමරවලින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.5,933,711 ක හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වත්තල හැඳළ හන්දියේ වෙළඳ සංකීර්ණ භූමියේ පිහිටි කුකුළු මස් කඩයකින් 2013 සිට 2015 වර්ෂය දක්වා අයවිය යුතු රු.613,085 ක හිඟ බදු මුදල් අයකර ගැනීම වෙනුවෙන් 2017 පෙබරවාරි 16 දින අදාළ බදුකරු වෙත එන්තරවාසියක් යැවීම හැරුණු කොට එහි ඉදිරි කටයුතුවල ප්‍රගතියක් නොවීය.

(ඉ) හැඳල හංදිය වෙළඳ සංකීර්ණය පිටුපස කඩ කාමර 29 ක් වසා තිබූ අතර මෙම වෙළඳ සංකීර්ණය නවතාවයකට පත්කර ආදායම් වැඩි කර ගැනීම සඳහා සැලකිල්ල යොමුකර නොතිබුණි.තවද වෙළඳ සංකීර්ණය පිටුපස කොටස වාහන නැවතුම් ස්ථානයක් ලෙස භාවිතා කරන බව දක්නට ලැබූ අතර සභාව ඒ සඳහා ගාස්තු අයකිරීමක් කර නොතිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

---------------

(අ) නගර සභා බල ප්‍රදේශය තුළ බැංකු කටයුතු පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛා 03 කින් හා මූල්‍ය කටයුතු පවත්වා ගෙන යනු ලබන මූල්‍ය සමාගමකින් සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

(ආ) සංචාරක සංවර්ධන පනත යටතේ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි අවහන්හල්වලින් අයකර තිබූ රු.323,671 ක බලපත්‍ර ගාස්තු සඳහා පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගත් පිරිවැටුමෙන් සියයට 1 අදාල කරගෙන නොතිබුණි.

2.3.5 වෙනත් ආදායම්

----------------

2017 දෙසැම්බර් 31 දින වන විට අයකළ යුතුව තිබෙන රු.3,084,400 ක කසල අපහරණ ගාස්තු හිඟ ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

--------------------------------------------------

(i) 2013 වර්ෂයේදී රු.9,475,000 වටිනාකමකට මිළදී ගෙන තිබූ අක්කර 01 පර්චස් 31.90 ක් වූ ඉඩම තුළ කසල වෙන්කිරීමේ අංගනයක් ඉදිකර, කසළ ක්‍රමානුකූලව බැහැරලීමේ ව්‍යාපෘතිය වහාම ඉටුකළ යුතු බවට පළාත් පාලන කොමසාරිස් විසින් උපදෙස් ලබාදී තිබූ අතර ඒ සඳහා 2016 අප්‍රේල් 02 දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් රු.1,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණද, ඉඩම වටා පැති බැම්මක් ඉදි කිරීම පමණක් සිදුකර තිබුණි.

(ii) පොලිතින් බේල් කිරීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2017 පෙබරවාරි මස සභාව වෙත ලබා දී තිබූ බේලින් යන්ත්‍රයේ කටයුතු සඳහා සේවකයින් දෙදෙනෙකුට අවශ්‍ය පුහුණුවීම් ලබාදී තිබූ නමුත් එහි කිසිදු ප්‍රගතියක් නොවීය.

(iii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර්තව්‍යයන් අයිතම් 47 කින් 23 ක් ක්‍රියාවට නංවා නොතිබූ අතර ප්‍රගතිය සියයට 50 හෝ ඊට අඩු මට්ටමක තිබුණි.

(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------------

පෙරටු කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් ලීබඩු උපකරණ මිලදී ගැනීමට රු.145,372 ක් වැය කර තිබුණද 2018 අප්‍රේල් 05 වන දින වන විටත් එම කාර්යාලය ස්ථාපිත නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

(i) සභා බල ප්‍රදේශයේ ජනනය වන කසළ කළමනාකරණය විධිමත්ව සිදුනොවීම නිසා කසළ බැහැරලීම වෙනුවෙන් දෛනිකව විශාල වැය බරක් දැරීමට නගර සභාවට සිදුවී තිබූ අතර පළාත් පාලන කොමසාරිස්ගේ 2008 නොවැම්බර් 20 දිනැති අංක WP/LPD/15/2008 දරන චක්‍රලේඛය ප්‍රකාරව කුණු කසළ ඉවත් කිරීමේ දී පරිසරයට හිතකර විධිමත් ක්‍රම වේදයක් අනුගමනය කිරීම සඳහා අඛණ්ඩව වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කොට නොතිබුණි.

(ii) වර්ග කිලෝමීටර් 10 කට ආසන්න නාගරික බල ප්‍රදේශය වෙනුවෙන් 30 කට වැඩි කම්කරුවන් සංඛ්‍යාවක් කසළ රැස්කිරීමේ කටයුතු වෙනුවෙන් යොදවා තිබුණද, කසළ වර්ගීකරණය කර ලබාගැනීමේ කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවතුණු අතර මිශ්‍ර කසළ විවෘත

ප්‍රදේශයකට බැහැරලීම මඟින් අවට පදිංචිකරුවන්ට හා පරිසරයට තර්ජනයක් වෙමින් පැවති බව 2017 නොවැම්බර් 02 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) ගාස්තු නොගෙවන ව්‍යාපාරික ස්ථානවල කසළ ඉවත් කිරීම නගර සභාව විසින් සිදුනොකිරීම හේතුවෙන් ප්‍රධාන මාර්ගවල තැන තැන කසළ දමා තිබූ අතර එම ආයතන සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කර නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව විසින් දැනුවත්වීමක් සිදුව නොතිබුණි

3.2 කළමණාකරන දුර්වලතා

--------------------------

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2014 දෙසැම්බර් මාසයේ ලැබී තිබූ රු.3,995,000 ක් වටිනා ට්‍රැක්ටරයේ හා කම්පැක්ටර් යන්ත්‍රයේ පළමු සේවා කිරීම වාහන ලබාගත් ආයතනයෙන් කරගැනීමට නියමිතව තිබියදී වෙනත් ආයතනයකින් සිදු කරගෙන රු.14,575 ක් වැය කර තිබුණි. මෙම සේවාව සිදුකිරීම 2015 මැයි 19 දින සිට 2015 ජූලි 03 දින දක්වා පමාවී තිබූ හෙයින් නොමිලයේ ලබාදෙන දෙවෙනි හා තෙවෙනි සේවා සිදුකළ බවට ගොනුවේ සාක්ෂි නොතිබුණි. කම්පැක්ටර් යන්ත්‍රය 2016 අගෝස්තු 05 දින අනතුරකට භාජනය වීම හා 2017 ජූනි 13 දින බැකෝ යන්ත්‍රයක වැදී රිම් එක කැඩීම හේතුකොට ගෙන අලුත්වැඩියා කිරීම් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කර නොතිබුණි. පළමු අනතුර සඳහා රක්ෂණ සමාගම සමඟ කටයුතු කර නොතිබූ අතර දෙවන අනතුර සඳහා රක්ෂණ සමාගමෙන් රු.48,745 ක් ලැබී තිබුණද, මුළු අලුත්වැඩියා වියදම රු.58,200 ක් වූයෙන් සභාවට සිදුවී ඇති පාඩුව රු.9,455 ක් විය. මෙම පාඩුවට වගකිව යුතු අය සොයා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නගර සභාවේ පෙර පාසල අලුත්වැඩියා කිරීම සඳහා රු.1,999,772 ක මුදලකට 2017 දෙසැම්බර් 04 දින මාස 3 කින් නිම කිරීමට ගිවිසුම් ගතව 2018 මාර්තු 04 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ අතර කොන්ත්‍රාත් සමිතිය විසින් වැඩ ආරම්භ කිරීම සඳහා සියලු දේ එක්රැස් කර තිබියදී පෙර පාසලක් සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර ඇති බව තාක්ෂණික නිලධාරි විසින් 2018 මාර්තු 16 දින ලේකම් වෙත වාර්තා කර තිබුණි. සභාව විසින් සැලසුමකින් තොරව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම නිසා මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් ගතවීම සිදුව තිබුණි.

(ඇ) 2017 අයවැය මගින් රු.8,400,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ ව්‍යාපෘතීන් 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සාධන ඇපකරයන්ද ලබාගෙන සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුවේ ගිවිසුම් ගතවීම් සිදු කර තිබූ අතර තාක්ෂණ නිලධාරි විසින් එම ගිවිසුම් ක්‍රියාත්මක නොකරන බව ව්‍යාපෘතිය නිම කිරීමට ආසන්න දිනයක් වූ 2018 මාර්තු 16 දින වාර්තා කර තිබුණි.

3.3 ප්‍රසම්පාදනය

--------------

3.3.1 සැපයීම් හා සේවා

-------------------

(අ) නගර සභාවට වාහන පිරිසිදු කිරීමේ කටයුතු සඳහා කොම්ප්‍රෙෂරයක් සහ වාහන සේදුම් ජල පීඩන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු. 346,314 ක් වැයකර තිබුණි. අවශ්‍යතාවය Motor power 5 HP හා Motor power k.w.3.7 ක් වුවද, මිලදී ගෙන තිබුණේ Motor power 3 HP හා Motor power k.w.2.2 ක ධාරිතාවයක් සහිත කොම්ප්‍රෙෂරයක් හා ජල පීඩන යන්ත්‍රයකි. වැඩ අධිකාරිගේ නිර්දේශ මත පමණක් මෙම මිලදී ගැනීම සිදුකර තිබුණි.

(ආ) නගර ශාලව සඳහා උත්සව මේස, පුටු හා උපකරණ මිලදී ගැනීමේදී කිසිඳු ප්‍රසම්පාදන ලියවිල්ලක සාම්පල් පරීක්ෂා කිරීම අවශ්‍යා බව දක්වා නොතිබියදී දෙවන අවම මිල ඉදිරිපත් කර තිබූ ටෙන්ඩරය සාම්පල් ඉදිරිපත් කර නොමැති බව දක්වා තාක්ෂණ ඇගයීම් කමිටුව ප්‍රතික්ෂේප කර තිබුණි.තවද අමුත්තන් සඳහා පුටු 15 ක් මිලදී ගැනීමේදී උත්සව ශාලා පුටු හා මේස මිලදී ගත් ආයතනයෙන්ම මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර තිබූ නමුත් මේ සඳහා පිරිවිතරයන් ප්‍රසම්පාදන ලියවිලි සමග ඉදිපත්කර නොතිබුණි. මෙම මිලදී ගැනීම සඳහා රු.3,542,685 ක් වැය කර තිබූ අතර දෙවන අවම මිල ඉදිරිපත් කල ආයතනය සමඟ සාකච්ඡා කර තීන්දුවක් ගත්තේ නම් රු. 910,035 ක මුදලක් සභාවට ඉතිරි කර ගත හැකිව තිබුණි.

(ඇ) ලීටර් 4000 ක ධාරිතාවයෙන් යුත් නව ගලි බවුසරයක් මිලදී ගැනීම සඳහා රු.5,960,000 ක් වැයකර තිබුණි. මෙහිදී මිල ගණන් කැඳවීම සඳහා වූ පුවත්පත් දැන්වීම අනුව වාහනය හා බවුසරය යන දෙකම සඳහා එකට මිල ගණන් කැඳවා 2016 ඔක්තෝබර් 17 දින මිල ගණන් විවෘත කර තිබූ අතර අවම ලංසුව ලැබී තිබූ ආයතනය ඔවුන් විසින් ඉදිරිපත් කර තිබුණේ වාහනයට පමණක් යයි පවසා 2016 නොවැම්බර් 04 දින එයින් ඉවත් වන බව ලිඛිතව දන්වා තිබුණි.එසේ වුවද ටෙන්ඩරය පිරිනමා තිබූ දෙවන අඩුම ටෙන්ඩර්කරු විසින් ට්‍රක් රථයට ගලි බවුසරය සවිකිරීමේ කාර්යය නිමකරගෙන තිබුණේ ටෙන්ඩරය ඉවත් කර ගත් අඩුම මිල ලැබූ ආයතනයෙන් විය. අවම ලංසුව ලැබී තිබූ ආයතනයෙන් ලංසු ඇපයක් ලබාගෙන නොතිබූ හෙයින් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකිවී තිබුණි.

3.3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

ඖෂධ පැළෑටි තැබීමට ස්ථානයක් සකස් කිරීම රු.367,402 ක ඇස්තමේන්තුවක් මත ක්‍රීඩා සංවර්ධන සමිතියකට පවරා වැඩ අවසන් කිරීමෙන් පසු රු.265,161 ක් ගෙවීම් කර තිබුණද අවසන් වැඩ විෂයය වන බිම සකස් කිරීම ඉටුකර නොතිබුණි. 2018 පෙබරවාරි 15 දින භෞතික පරීක්ෂාව සිදු කරන ලද දින වන විටත් එම ස්ථානයේ භූමිය නිසි ලෙස සකස්කර නොතිබූ අතර ඔසු පැළ නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා එම පැළ මැරී තිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | ආදායම් වැඩිකර ගැනීම සඳහා කටයුතු නොකිරීම හා හිඟ ආදායම් අය කිරීම සඳහා නඩු කටයුතු සිදු නොකිරීම. |
| (ආ) | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | සැලසුමකින් තොරව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම හා ගිවිසුම් ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) | කසළ කළමනාකරණය | විධිමත් ක්‍රමවේදයක් හා වැඩ පිළිවෙලක් නොමැති වීම. |